# භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය සඳහා විද්‍යුත් වෙළඳපොළ

ආරියදාස ජයවර්ධන
අධ්‍යක්ෂ
කාර්මික තාක්ෂණවේදී තො.සේවා මධ්‍යස්ථානය

විවෘත වෙළඳපොළ ආර්ථිකයක් තුළ ඕනෑම භාණ්ඩයක්, සේවාවක් සඳහා සාර්ථක වෙළඳපොළක් පවත්වා ගැනීමට වෙළඳපොළ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. ප්‍රවර්ධනය මගින් පාරිභෝගිකයා එම භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට යම්කිසි පෙළඹීමක් සිදු කරයි. වර්තමානයේ වෙළඳපොළ ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නා බොහොමයක් ක්‍රියා මාර්ග අතර, අන්තර්ජාලය වෙබ් අඩවි යොදා ගැනීම, විද්‍යුත් වෙළඳාමේ නවතම ප්‍රවනතාවයයි.

## විද්‍යුත් වෙළඳාම ( E - Commerce )

පරිගණක මගින් අන්තර්ජාලයෙහි වෙබ් අඩවි හරහා භාණ්ඩ හා සේවා විකිණීම සහ මිලදී ගැනීම විද්‍යුත් වෙළඳාම ලෙස හැඳින්විය හැකිය. සාමාන්‍ය වෙළඳපොළ මෙන් සෘජුවම විකුණුම්කරුවන් ගැණුම්කරුවන් මුහුණට මුහුණලා මූණ ගැසීමක් සිදු නොවූවද, අන්තර්ජාලයේ ස්විච හමුවීමටත් පාරිභෝගිකයාට ඔහු මිලදී ගන්නා භාණ්ඩය හෝ සේවාව පිළිබඳ දැක බලාගෙන තොරතුරු ලබා ගැනීමටත් හැකිවේ. සාමාන්‍ය වෙළඳාමේදී රුපියල් ශත හුවමාරු වුවද විද්‍යුත් වෙළඳාමේදී එසේ මුදල් නෝට්ටු, චෙක්පත් මුදල් ඇණවුම් හුවමාරුවක් සිදු නොවේ. සියළුම ගණුදෙනු කරනු ලබන්නේ ණය කාඩ්පත් උපයෝගීකර ගැනීමෙනි.

වර්තමානයේ ඉතා ජනප්‍රිය ගණුදෙනු සඳහා භාවිතා කරන මෙම ණය කාඩ්පත් ක්‍රෙඩිට් කාඩ් වශයෙන් හැඳින්වේ. ඒවා වානිජ්‍ය මුල්‍ය බැංකු ආයතන මගින් ඕනෑම ව්‍යාපාරික ආයතනයකට පුද්ගලයෙකුට ලබාගෙන ව්‍යාපාරික ගණුදෙනුවලදී භාවිතා කළ හැකි වේ. පාරිභෝගිකයා හෝ භාණ්ඩ මිලදී ගනු ලබන්නා සියළුම තොරතුරු අන්තර්ජාලයේ වෙබ් අඩවි මගින් ලබාගත් පසු ණය කාඩ්පතක් මගින් මුදල් ගෙවා භාණ්ඩ ඇණවුම් කළ හැකිවේ. භාණ්ඩ රැගෙන ඒමට වෙළඳසැලට යාමට අවශ්‍ය නැත. මේ නිසා විශාල මුදල් ප්‍රමාණයක් වුවද සුරක්ෂිතව රටින් රටට තිබෙන විදේශ මුදල් සීමා වලින් තොරව භාවිතා කළ හැකිවී ඇත. ලෝකයේ දියුණු හුවමාරු සේවා ප්‍රයෝජනයට ගෙන භාණ්ඩ ප්‍රවාහනය අදාල පාරිභෝගිකයා වෙත ගෙනවිත් දීම සිදු කෙරේ. මෙලෙස වෙබ් අඩවි ප්‍රයෝජනයට ගෙන ඒවා හරහා ලෝකයේ ඕනෑම රටක ඕනෑම සමාගමකට නව භාණ්ඩ හා සේවා තම පාරිභෝගිකයන්ට විකිණීමට හැකි වන අතර, ඕනෑම පාරිභෝගියෙකුට එම භාණ්ඩ එමගින් මිලදී ගැනීමටද හැකිවේ.

## විද්‍යුත් වෙළඳපොළ භාවිතය

යම්කිසි ආයතනයකට විද්‍යුත් වෙළඳපොළ භාවිතය සඳහා එම ආයතනය සතු අන්තර්ජාල වෙබ් අඩවියක් නොමැති අවස්ථාවක වුවද වෙබ් අඩවි නිර්මාණයකර පවත්වාගෙන යන ආයතනයක් මගින් විද්‍යුත් වෙළඳපොළ භාවිතය සිදු කළ හැකිවේ. විද්‍යුත් වෙළඳපොළ මගින් ඕනෑම භාණ්ඩයක් අලෙවි කිරීම සිදුකළ හැකි වුවද ජාත්‍යාන්තරව ජනප්‍රිය තත්ත්වයක් දක්නට ලැබෙන්නේ භාණ්ඩ සුළු ප්‍රමාණයකි.

විශේෂයෙන්ම පොත්පත් සහරා ගීත හා චිත්‍රපට සංයුක්ත තැටි ඒවා අතර ප්‍රධාන වේ. ඇමසන් පොත් ව්‍යාපාරය වසරකට ඇමරිකන් ඩොලර් මිලියන 150 කට ආසන්න වටිනාකමක පොත්පත් සහරා අලෙවි කරන අතර, ඇමරිකා එක්සත් ජනපදය වාර්ෂික මෝටර් රථ අලෙවියෙන් 15% කට නොඅඩු ප්‍රමාණයක් විද්‍යුත් වෙළඳාම මගින් සිදු කරයි. එමෙන්ම ජපානය ටොයොටා ආයතනය විශාලතම අන්තර්ජාල පද්ධතියක ඉඩකඩ පවත්වාගෙන යයි. ලෝකයේ පරිගණක අලෙවි කරන ඩේල් පරිගණක ව්‍යාපාරය වසරකට ඩොලර් මිලියන පහකට නොඅඩු වටිනාකමක පරිගණක සහ පරිගණක සේවා අලෙවි කරන සිස්කෝ (CISCO) ආනයනය පරිගණක ජාල පද්ධති භාණ්ඩ ඇමරිකන් ඩොලර් බිලියනයකට අධික වටිනාකමකට අලෙවි කරන බවත්, වාර්තා වෙයි.

ලෝකයේ දියුණු රටවල බෙහෙවින් භාවිතයට ගැනෙන විද්‍යුත් වෙළඳාම භාවිතයේ ඉහල වර්ධනයක් දක්නට ඇත. මෙලෙස පොත්, සහරා මෝටර් රථ වාහන, පරිගණක, විදුලිමය භාණ්ඩ බොහොමයක් විද්‍යුත් වෙළඳාම මගින් පහසුවෙන් අලෙවි කිරීම සිදු කළ හැකිවේ. එමෙන්ම විවිධ සේවාවන්ද අලෙවි කිරීමට පහසුකම් අන්තර්ජාලයේ විද්‍යුත් වෙළඳාම ඔස්සේ සිදු කළ හැකි වේ. දුම්රිය ප්‍රවාහන සේවා, සෞඛ්‍ය සේවා, රක්ෂණ සේවා, අධ්‍යාපන සේවා, ගුවන් සේවා වැනි බොහෝ සේවාවන් රැසක් තොරතුරු තාක්ෂණයේ භාවිතයෙන් අන්තර්ජාලයේ විද්‍යුත් වෙළඳාමට එක්වී ඇත. ජාත්‍යාන්තර දත්ත ආයතනය ( International Data Corporation) තොරතුරුවලට අනුව මෙම ක්ෂේත්‍රය

බෙහෙවින්ම ජනප්‍රියවී ඇති රටවල් අතර, ඇමරිකා එක්සත් ජනපදය ප්‍රධාන තැනක් ගෙන ඇත. විද්‍යුත් වෙළඳාම භාවිතා කරන පාරිභෝගික සංඛ්‍යාව කෝටි 5 ට අධික වේ. 90 දශකයේ එනම් 1995 අන්තර්ජාලය හඳුන්වා දුන් ශ්‍රී ලංකාවේ අද වන විට අන්තර්ජාලය සෘජුව භාවිතා කරන සංඛ්‍යාව සංනිවේදන ආයතනවල දත්තවලට අනුව ලක්ෂ 03 කට ආසන්න වේ.

## විද්‍යුත් වෙළඳාම හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර

වෙළෙන්දාට මෙන්ම පාරිභෝගිකයාටද වාසි ලැබිය හැකි අන්තර්ජාල විද්‍යුත් වෙළඳාම කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාරවලටද යොදා ගැනීමට හැකිවේ. විශේෂයෙන්ම පිරිවැය අඩුවීම, ලාභය වැඩිවීම මෙමගින් අතරමැදියන් නොමැති නිසා සිදුවේ. ශ්‍රමය අඩුවෙන් වැයවීම කාර්යක්ෂමතාවය වැඩිවීම, ජාත්‍යාන්තර ව්‍යාප්තවීමට පහසුවීම මෙහි තිබෙන වාසි අතර ප්‍රධානයි.

ජාත්‍යන්තර ප්‍රමිතියට සහ වගකීම් සහතික වලට අනුකූලව භාණ්ඩ හා සේවා අලෙවියට තැබීමට සිදුවීම මූලික මෙන්ම ප්‍රධානතම පාරිභෝගික අවශ්‍යතාවය වේ. එසේ නොවන අවස්ථාවලදී විද්‍යුත් වෙළඳාම මගින් පාරිභෝගික විශ්වාසය දිනා ගැනීම ඉතාමත් අසීරු කාර්යයකි. තත්ත්වයෙන් උසස් ප්‍රමිතියට අනුකූලව බොහොමයක් භාණ්ඩ හා සේවා සිදු නොකිරීම දියුණුවෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල විද්‍යුත් වෙළඳාම ජනප්‍රිය වීමේ ප්‍රවණතාවය අඩුවීමට බෙහෙවින්ම බලපා ඇත.

**භාණ්ඩ හා සේවා විශාල පරාසයක් පහසුවෙන් පාරිභෝගිකයාට ඉදිරිපත් කිරීමටත්, තොරතුරු ඉතාම ඉක්මණින් ලබාගෙන භාණ්ඩයේ මිල සමග තත්ත්වය ඉතාමත් පහසුවෙන් සසඳා බැලීමටත් හැකියාව තිබෙන විද්‍යුත් වෙළඳපොළ කුඩා ව්‍යාපාරවලට වුවද පහසුවෙන් සිය පාරිභෝගිකයින් නතුකර ගතහැකි පහසු නව වෙළඳපොළ ප්‍රවනතාවයකි.**


# තොරතුරුවලින් පෝෂණයවී ඔබේ ව්‍යාපාරය සාර්ථකකර ගන්න

## ඔබේ කාර්මික තොරතුරු අවශ්‍යතා සපුරාලන කාර්මික තොරතුරු සේවය

නව කර්මාන්තයක් ආරම්භ කිරීමේදී හෝ පවතින කර්මාන්තයක් පවත්වාගෙන යාමේදී ඔබට ඇතිවන ගැටළු නිරාකරණය කරගැනීමට සහාය වීම අපේ මෙහෙවරයි. ඔබේ සුවිශේෂී වූ ගැටළු අප වෙත යොමු කරන්න.

- ඔබේ හැකියාව සහ අවශ්‍යතාව හඳුනාගෙන වඩාත් ගැලපෙන කර්මාන්තයක් තෝරා ගැනීමට සහාය වීම සහ උපදේශක සේවා සැපයීම.
- කර්මාන්ත ආරම්භ කිරීමට හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සේවා සැපයීම.
- විවිධ නිෂ්පාදන පිළිබඳ තොරතුරු සහ දේශීය හා විදේශීය යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනකරුවන් පිළිබඳ තොරතුරු සැපයීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සුවිශේෂිවූ පුස්තකාල විමර්ශණ සේවා සැපයීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය මගින් අන්තර් ජාලයේ ප්‍රචාරයක් ලබාදීම.
- කාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ව්‍යාපෘති වාර්තා, තාක්ෂණික අත්පොත්, තාක්ෂණික තොරතුරු ගොනු, කර්මාන්ත සඟරාව සහ ප්‍රකාශන මගින් තොරතුරු සේවා සැපයීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා ව්‍යාප්ත වූ දිස්ත්‍රික් කාර්යාලවල කෙරෙන සේවා පිළිබඳ තොරතුරු සැපයීම.

**විමසීම්**

**අධ්‍යක්ෂ**
කාර්මික තාක්ෂණවේදී තොරතුරු සේවා අංශය,
615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
දු.අංක: 2605372, 2612603,
ඊ මේල් : idbitd@sltnet.lk ෆැක්ස් : 2622745.